www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ/සමාජවාදී සමානතා පක්ෂ සමුලුව යුද්ධයට එරෙහි සමාජවාදී ජාත්‍යන්තරවාදී ඉදිරි දර්ශනයක් සම්මත කර ගනී

**International Students for Social Equality/Socialist Equality Party conference adopts socialist internationalist perspective to oppose war**

**ටොම් කාටර් විසිනි**
**2007 අප්‍රේල් 2**

සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) සහ සමාජවාදී සමානතා පක්ෂය (සසප) යුද්ධයට එරෙහිව කැඳවූ හදිසි සමුලුවේදී අප්‍රේල් 1 දා මිලිටරිවාදයට සහ යුද්ධයට එරෙහිව සමාජවාදී සහ ජාත්‍යන්තරවාදී වැඩ පිලිවෙලක් ඉදිරිපත් කෙරෙන යෝජනාවක් ඒකච්ඡන්දයෙන් සම්මත විය. මෙම දෙදින සමුලුව කැඳවනු ලැබුවේ ඉරාකය තුල යුද්ධය නතර කිරීම සඳහාත් ඉරානයට එරෙහි යුද්ධයක් පුපුරා යාම වැලැක්වීම සඳහාත් එක්සත් ජනපදය තුල සහ ජාත්‍යන්තරව ශිෂ්‍ය තරුන-තරුනියන් ද සමස්තයක් ලෙස කම්කරු පංතිය ද බල මුලු ගැන්වීම සඳහා වැඩ පිලිවෙලක් වර්ධනය කරනු පිනිසය.

ඈන් ආබර් හි මිචිගන් සරසවි භූමිය තුල පැවැත්වූ මෙම සමුලුවට එක්සත් ජනපදයේ හා වෙනත් රටවල් ගනනාවක ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ කම්කරුවන් සියයකට අධික සංඛ්‍යාවක් සහභාගි වූහ. මිචිගන්, ඔහියෝ, කෙන්තකී, මැසචූසෙට්ස්, නිව් ජර්සි, නිව්යෝර්ක්, ඉලිනොයිස්, මිනසෝටා, පෙන්සිල්වේනියා, වොෂින්ටන්, ෆ්ලොරිඩා, ටෙක්සාස්, කොලරාඩෝ, කනෙක්ටිකට්, ඔරිගොන් සහ වර්ජිනියා යන ප්‍රදේශ වලින් සමුලුව නියෝජනය විය. නියෝජිතයන් දාහත් දෙනෙකු කැනඩාව නියෝජනය කල අතර අනෙක් අය පැමිනියේ ජර්මනියෙන් සහ ඕස්ට්‍රේලියාවෙනි.

ඕස්ට්‍රේලියාවෙන් බ්‍රිතාන්‍යයෙන් තුර්කියෙන් සහ රුමේනියාවෙන් සමුලුවට සුබ පැතුම් ලැබින. සමුලුවට සහභාගි වීමේ උවමනාව පල කල පකිස්ථානය රුමේනියාව ෆිලිපීනය දකුනු අප්‍රිකාව සැම්බියාව එක්සත් අරාබි එමිරේටය බංග්ලා දේශය හයිටි නයිජීරියාව තුර්කිය පලස්තීනය ඝානා සහ වෙනිසියුලාව යන රටවල ආධාරකරුවන්ට අධික ගමන් වියදම නිසාත් එක්සත් ජනපදයට ඇතුලුවීමේ දුෂ්කරතාව නිසාත් සහභාගි වීමට නොහැකි විය.

සසජාශි මෙහෙයුම් කමිටුවේ සාමාජිකයකු සහ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ලේඛකයකු වන ජෝ කේ ඔහුගේ ආරම්භක පැහැදිලි කිරීමේ දී සමුලුවට තානය සැපයීය. "අප මෙහි රැස්ව සිටින්නේ අධිරාජ්‍යවාදය විසින් නිර්මිත ව්‍යසනයෙන් බියපත්ව සහ යුද්ධයේ සහ මිලිටරිවාදයේ ඍජු ගොදුරු බවට පත්ව සිටිනා ලොව වටා කෝටි සංඛ්‍යාත මහජනතාවගේ යුද විරෝධී සහ අවමානිත හැඟීමට හඬක් ලබා දීමටයි" යනුවෙන් කේ පැවසීය.

"ජාත්‍යන්තරව පවත්නා දේශපාලන ව්‍යුහයන්ගේ සහ ආයතනයන්ගේ රාමුව තුල ලෝක ජනගහනයේ අති මහත් බහුතරයගේ අවශ්‍යතාවලට සහ අදහස් වලට ප්‍රකාශනයක් සොයා ගත නොහැක. අප මෙහි රැස්ව සිටින්නේ මෙම අවශ්‍යතා සහ අදහස් වලට සවිඥ්ඥානක ප්‍රකාශනයක් ලබා දීමට සහ යුද්ධය නිමා කල හැකි දේශපාලනික වැඩ පිලිවෙලක් විස්තාරනය කිරීමටයි." ඔහු තව දුරටත් ප්‍රකාශ කලේය.

සසජාශි හි මූලික දේශපාලනික ඉදිරි දර්ශනය සහ ක්‍රියා මාර්ගය සංක්ෂිප්ත කොට දැක්වෙන යෝජනාවක් කේ විසින් සාකච්ඡාව සඳහා හඳුන්වා දුනි. "යුද්ධය සම්බන්ධයෙන් අපේ ප්‍රතිචාරය එහි යටින් පවත්නා පොදු ප්‍රවනතා පිලිබඳ අපේ අවබෝධය මත පදනම්විය යුතුයි." ඔහු පැවසීය. "යුද්ධය යනු ධනේශ්වර පද්ධතියේ නිෂ්පාදිතයක් නම් ධනවාදය අහෝසි කිරීමෙන් තොරව යුද්ධය අවසන් කල නොහැක. යුද්ධයට එරෙහි ව්‍යාපාරයක් ධනවාදයට එරෙහි ව්‍යාපාරයක් විය යුතුයි."

ලාභ පද්ධතිය තුල සහ තරගකාරී ජාතික රාජ්‍යයන්ට ලෝකය බෙදා වෙන් කිරීම තුල රඳා පවත්නා අධිරාජ්‍යවාදී යුද්ධයේ මූලයන් යෝජනාවෙන් ඍජුව පෙන්වා දුනි. "ඉරාකයට එරෙහි යුද්ධය අධිරාජ්‍යවාදී යුද්ධයකි." යනුවෙන් යෝජනාවේ සඳහන්විය. " එය එක්සත් ජනපදයේ සංගත සහ මූල්‍ය කතිපයාධිකාරිත්වයේ ද බ්‍රිතාන්‍යය සහ අනෙකුත් රටවල සිටින එහි සගයින්ගේ ද අවශ්‍යතා මත සිදු කරන ලද ආක්‍රමනශීලි ක්‍රියාවකි. විසිවන සියවසේ ලෝක යුද්ධ වල දී මෙන්ම සිදු වෙමින් පවත්නේ භූගෝලීය සම්පත් යලි බෙදා ගැනීමකි. මෙහි දී එක්සත් ජනපද පාලක

පංතිය ප්‍රධාන මූලෝපායික කලාප මත තම මිලිටරි බලය තහවුරු කර ගැනීමට මාන බලයි."

එක්සත් ජනපද මිලිටරිවාදයේ මෑත පුපුරා යාමේ මූලයන් පවත්නේ එක්සත් ජනපද ධනවාදයට ගෝලීය පරිමානව ආර්ථික වශයෙන් පැවති ස්ථානය පසු ගිය අඩ සියවස තුල ඓතිහාසිකව කඩා වැටීම තුල බැව් යෝජනාව පෙන්වා දුනි. "ඇමරිකානු ධනවාදය රඳ පවත්නේ දැවැන්ත ප්‍රාග්ධන ආගලනයන් පෙර නොවූ විරූ මට්ටම්වල නය සහ විවිධාකාරයේ මූල්‍යමය සමපේක්ෂනයන් සහ උපාමාරු වලින් සමන්විත බිඳෙන සුලු අස්ථාවර පදනමක් මතයි. එක්සත් ජනපදය තුල සිටිනා දූෂිත පාලක ප්‍රභුවක් කඩා වැටෙමින් පවත්නා තම ආර්ථික බලය යලි ගොඩ නගා ගැනීම සඳහා තම අති මූලික හැකියාව සහ ශක්තිය එනම් ලෝකයේ අන් සියලුම රටවල යුද වියදම් ඉක්මවා යන යුද අයවැයකින් පවත්වා ගෙන යන සන්නද්ධ බලකාය වඩ වඩාත් යොදා ගැනීමට මාන බලයි."

අධිරාජ්‍යවාදයට ගාමකය ලබා දෙන්නාවූ ආර්ථික හා සමාජ අවශ්‍යතාවන්ට මුලුමනින්ම පටහැනි අවශ්‍යතාවන් සහිත සමාජ බලවේගය වූ ජාත්‍යන්තර කම්කරු පංතිය යුද්ධය නිමා කිරීමට සමත් එකම බලවේගය බැව් යෝජනාව අවධාරනය කරයි. මෙම පංතියේ ජාත්‍යන්තර ස්වභාවය සහ එය මුහුන දෙන දැවැන්ත සමාජ ප්‍රශ්න විසින් එයට ජාත්‍යන්තර ක්‍රියාමාර්ගයක් ආවශ්‍යක කෙරෙන බැව් යෝජනාවෙන් තර්ක කෙරේ. "අධිරාජ්‍යවාදයේ භූගෝලීය මූලෝපායට ප්‍රතිමුඛව කම්කරු පංතියේ භූගෝලීය මූලෝපායක් පිහිටුවිය යුතු අතර එය සියලු ආකාරයේ ජාතිකවාදයන්ට එරෙහි වූවක් ද විය යුතුය." යනුවෙන් එය ප්‍රකාශකරයි.

"එක්සත් ජනපද යුද සැලසුම් වලට විරුද්ධත්වය ප්‍රකාශ කිරීම සඳහා 2003 පෙබරවාරියේ දී ලොව වටා දස ලක්ෂ සංඛ්‍යාත මහ ජනතාව වීදි බට" බැව් යෝජනාව නිරීක්ෂනය කරයි. කෙසේ නමුදු මෙම මෙම ව්‍යාපාරය විරෝධතා දේශපාලන ඉදිරි දර්ශනයන්ගේ ආධිපත්‍යයට යටත් ව තිබූ බැවින් "සිව් වසරකට පසුවද, මහජන විරෝධය ඉහල නැග තිබියදී පවා, යුද්ධය ඉදිරියට ඇදෙයි."

ඒ හෝ මේ ආකාරයෙන් දේශපාලන සංස්ථාපිතයට ගැට ගැසුනු සියලු පක්ෂ සහ කන්ඩායම්වලින් කම්කරු පංතිය දේශපාලනිකව ස්වාධීන කර ගැනීමේ අවශ්‍යතාව යෝජනාව අවධාරනය කරයි."ඩිමොක්‍රැටික් පක්ෂයෙන් හා ඩිමොක්‍රැටිකයනට පීඩනය යෙදීමට උත්සාහ කරන්නවුන්ගෙන් පරිපූර්නව බෙදී වෙන් වීමක්" එක්සත් ජනපදය තුල දී අවශ්‍ය වේ.

"ආක්‍රමනය සූදානම් කිරීමේ සිට යුද්ධයේ මෑතම උත්සන්න කිරීම දක්වා එක්සත් ජනපද ඩිමොක්‍රැටික් පක්ෂය බුෂ් පරිපාලනයේ සාපරාධී හවුල්කරුවාගේ භූමිකාව රඟ දැක්වීය." යනුවෙන් යෝජනාවේ සඳහන්වේ. "ඩිමොක්‍රැටික් පක්ෂය අධිරාජ්‍යවාදී ධනපති පක්ෂයක් වන අතර ඩිමොක්‍රැටික් පක්ෂයේ සිටින සයලුම කොටස් - විවෘත ප්‍රතිගාමීන්ගේ සිට අනුචිතව නම් ලද "ඉරාකයෙන් ඉවත්වීමේ කන්ඩායම" දක්වා" වග කිව යුතුය. ඩිමොක්‍රැටික් පක්ෂයේ ප්‍රධාන උත්සුකය වන්නේ සමාජ විරෝධතාව සමහන් කිරීමට සහ ද්වි-පක්ෂ ක්‍රමයෙන් කැඩී එන ව්‍යාපාරයක් වර්ධනයවීම අඩාල කර දැමීමට යත්නමින් සැහෙන ලෙසට තම ප්‍රසිද්ධ ආස්ථානයන් සීරු මාරු කිරීමයි.

ලොව පුරා කම්කරුවන් සමාන දේශපාලනික අභියෝගයන්ට මුහුන දෙමින් සිටින බැව් යෝජනාව මගින් අවධාරනය කෙරේ. "කැනඩාවේ ලිබරල් පක්ෂය සහ නව ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය, බ්‍රිතාන්‍යයේ කම්කරු පක්ෂය, ඕස්ට්‍රේලියානු කම්කරු පක්ෂය, ප්‍රංශයේ හා ස්පාඤ්ඤයේ සමාජවාදී පක්ෂ සහ ජර්මනියේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය වැනි වාමාංශිකයැයි කියා ගන්නා මෙම සියලු සංවිධාන එක්කෝ දක්ෂිනාංශික සහ මිලිටරිවාදී පිලිවෙත් වලට සහාය දුන්හ. නැතහොත් ඒවා ඍජුව ක්‍රියාවට නැංවූහ."

යෝජනාව මෙසේ අවධාරනය කරයි:"කම්කරු පංතියේ දේශපාලන ස්වාධිනත්වය සඳහා වන සටනට විප්ලවවාදී ජාත්‍යන්තර සමාජවාදයේ ඉතිහාසය" මාක්ස් සහ එංගල්ස්ගේ සිට රුසියානු විප්ලවය, අද හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවෙන් නියෝජනය වන ස්ටැලින්වාදයට සහ සංශෝධනවාදයට එරෙහි ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ අරගලය දක්වා- දැනුවත්ව උකහා ගැනීම අවශ්‍ය කරයි."

යෝජනාව මෙසේ සමාප්ත වේ: "යුද්ධයට සහ ධනවාදී පද්ධතියට එරෙහි අරගලය මෙහෙයවනු පිනිස සමාජවාදී සමානතා පක්ෂය සහ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවත් එහි ශිෂ්‍ය සංවිධානය වන සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ ව්‍යාපාරයත් ගොඩ නගන ලෙස මෙම සමුලුව ලොව පුරා කම්කරුවන්ගෙන් හා තරුන තරුනියන්ගෙන් ඉල්ලා සිටී."

සමුලුවේ දෙවන දිනය වූ ඉරිදා, යෝජනාවෙන් සංක්ෂිප්තව ඉදිරිපත් කෙරුනු දේශපාලන ඉදිරි දර්ශනය සහභාගි වූ සියලුදෙනාගේ ඒකමතික සහයෝගයෙන් පිලි ගැනින. මෙම සතිය තුල ලෝක සමාජවාදී වෙබ් අඩවියේ එම යෝජනාව සම්පූර්නයෙන් පල කෙරේ.

ජෝ කේ විසින් හඳුන්වා දුන් යෝජනාව මත සිදු කෙරුනු සාකච්ඡාවේදී එක්සත් ජනපදය, ශ්‍රී ලංකාව, ඉතාලිය, කැනඩාව, ජර්මනිය, රුසියාව, ඉරානය සහ වෙනිසියුලාව යන රටවල් තුල දේශපාලනික තත්වය

පිලිබඳ වාර්තා ඉදිරිපත් කෙරින. එක්සත් ජනපදය පුරා සහ ජාත්‍යන්තරව උසස් විද්‍යාල හා සරසවි තුල සසජාශි ගොඩ නැංවීම සඳහා ක්‍රියාකාරී වූ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සහ පීඨ මගින් ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සහ තරුන-තරුනියන් මුහුන දෙන දේශපාලනික, සමාජ, සහ ආර්ථික වටපිටාව චිත්‍රනය කෙරුනු අතර යෝජනාවෙන් සංක්ෂිප්ත කෙරුනු සමාජවාදී සහ ජාත්‍යන්තරවාදී ඉදිරි දර්ශනයක ආවශ්‍යකතාව අවධාරනය විය.

සසප ජාතික ලේකම් සහ ලෝක සමාජවාදී වෙබ් අඩවි කර්තෘ මන්ඩල සභාපති ඩේවිඩ් නෝර්ත් තම අදහස් ඉදිරිපත් කරමින් සමාජයේ පවත්නා සමාජ සහ ආර්ථික සංවිධානයන් වඩ වඩාත් ප්‍රශ්නයට බඳුන් කරන මහා දේශපාලනික කම්පනයන්ගේ අනිවාර්යතාව අවධාරනය කලේය.

ඇමරිකානු ධනවාදයේ අනභියෝගී අධිකාරිත්වයෙන් සහ එක්සත් ජනපද මිලිටරියේ අසම සම භාවයෙන් සංලක්ෂිත ඓතිහාසික කාල පරිච්ඡේදය නිමා වෙමින් තිබූ බැව් නෝර්ත් පැවසීය. යුරෝපයේ සහ නැග එන ආර්ථික බලයන් වන චීනයේ සහ ඉන්දියාවේ ආනු භාවය වේගයෙන් වැඩෙද්දී ඇමරිකානු ධනවාදය කඩා වැටීමක පැවතුනි.

එක්සත් ජනපද ඉරාක ආක්‍රමනය වනාහි එම කඩා වැටීම මිලිටරි බලය යොදා ගනිමින් සමහන් කර ගැනැමට දැරුනු උත්සාහයක් බැව් නෝර්ත් පැවසීය. එමනිසා එම ව්‍යවසායේ අසමර්ථභාවය එක්සත් ජනපද ධනවාදයට ව්‍යසනකාරී පල විපාක අත් කර දී ඇත. මිලිටරි ප්‍රචන්ඩත්වය භාවිතා කිරීම හරහා තමාගේම අවශ්‍යතා සුරක්ෂිත කර ගනු වස් විවිධ අධිරාජ්‍යවාදී බලයන් උත්සාහ දරන නව ඓතිහාසික කාල පරිච්ඡේදයක් සඳහා වන පරිවර්තනයක් ක්‍රියාත්මක වෙමින් පැවතුනි.

මෙම සන්දර්භය තුල "එය කම්කරු පංතිය දේශපාලනයට මැදිහත් වීමට පූර්වයෙන් ගතවන කාලයක් පිලිබඳ ප්‍රශ්නයක් පමනක්" බැව් නෝර්ත් අවධාරනය කලේය. තීරනාත්මක ප්‍රශ්නය වන්නේ එම මැදිහත් වීමට මග පෙන්වීම කරනු ලබන්නේ කවර ක්‍රියා මාර්ගයක් ද මූලධර්මයන් ද හා ඉදිරි දර්ශනයක් ද යන්න බැව් නෝර්ත් අවධාරනය කලේය.

සාකච්ඡාවේ අනෙකුත් මාතෘකා අතර එක්සත් ජනපදය තුල දේශපාලනික හා සමාජ අර්බුදයේ මූලයන්, යුද-විරෝධී ව්‍යාපාරයේ ඉතිහාසය සහ එහි පාඩම්, සසජාශි හි අධ්‍යාපනික කාර්යයන්, කලාව හා සංස්කෘතියේ ගැටලු, සහ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ සංවර්ධනය අන්තර්ගත විය. සසජාශි හි ඉදිරි වැඩ කටයුතු කරගෙන යාම සඳහා ඩොලර් 11000 ක මුදලක් ද සමුලුවේ දී පරිත්‍යාග ලෙස එකතු විය.

මීට අමතරව මාර්තු 22 වන දා ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ යාපනය ආශ්‍රිත දිවයින් වල දී ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ සාමාජික නඩරාජා විමලේස්වරන් සහ ඔහුගේ මිතුරු සිවනාදන් මදිවදනන් ගේ අතුරුදහන්වීම සම්බන්ධයෙන් පරීක්ෂනයක් පවත්වන ලෙස ශ්‍රී ලංකාවේ ආන්ඩුවෙන් ඉල්ලා සිටින යෝජනාවක් ද සමුලුවේ දී ඒකච්ඡන්දයෙන් සම්මත කෙරින.

ශ්‍රී ලංකාවේ සසප නියෝජනය කරමින් සමුලුවට සහභාගි වූ පාවිනී සෝරා විසින් හඳුන්වාදුන් යෝජනාවේ "මෙම අතුරුදහන් වීමට ශ්‍රී ලංකාවේ මිලිටරිය සෘජුවම වගකිව යුතු බවට හෝ එයට සම්බන්ධිත බවට සෑම ඇගවුමක්ම පවතී." යනුවෙන් සඳහන් විය. "විමලේස්වරන් සහ මදිවදනන්ගේ ඉරනම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ආන්ඩුව වග කිවයුතු බව අප විශ්වාස කරන අතර ඔවුන් වහාම සහ සුරක්ෂිතව නිදහස් කරන බවට සහතිකයක් දෙන ලෙස ආන්ඩුවෙන් ඉල්ලා සිටිමු." යනුවෙන් එහි සඳහන් විය.

යෝජනාවෙන් පසුගිය අගෝස්තුවේ දී මුල්ලිපොතන තම නිවසේ දී මරා දැමුනු සසප ආධාරකරු සිවප්‍රගාසම් මරියදාස්ගේ ඝාතනය සම්බන්ධයෙන් සාධාරන පරීක්ෂනයක් පවත්වන ලෙසද ඝාතකයන් නීතිය ඉදිරියට පමුනුවා දඬුවම් පමුනුවන ලෙස ද ශ්‍රී ලංකාවේ ආන්ඩුවෙන් ඉල්ලා සිටී.

එහි මෙසේ සඳහන් වේ: "යුද්ධයට ඇති ඔවුනගේ විරුද්ධත්වය සහ සියලුම වර්ගයේ වාර්ගිකවාදී දේශපාලනයන්ට එරෙහිව ජාත්‍යන්තරවාදී සමාජවාදී ක්‍රියා මාර්ගයක් මත පාදකව කම්කරු පංතිය එකමුතු කිරීම සඳහා ඔවුන් ගෙන යන අරගලය හේතුවෙන් ශ්‍රී ලංකාවේ සසපට සහ මෙම පුද්ගලයන්ට එරෙහිව සිදු කෙරුනු දේශපාලනික අපරාධයක් ලෙස මෙම අතුරුදහන්වීම සහ ඝාතනය සමුලුව විසින් හෙලා දකී"